

# මනෝ
## සිංහල වේදිකාවේ සක්විති

**දයානන්ද රත්නායක**

ජයලත් මනෝරතන්න නම් වූ කලාකරුවා ඔබට කෙසේ හඳුන්වා දෙන්නදැයි මට නොවැටහේ. ඔහුගේ කලාත්මක භූමිකාවේ වපසරිය එතරම්ම පුළුල් පරාසයක විහිදී ඇති නිසා මනෝරත්නයන්ගේ රැඟුම් ගැයුම් ගැන අමුතුවෙන් හඳුන්වා දිය යුතු නැත. ලංකාවේ සිවු දිසාවේම රසිකයෝ ජයලත් මනෝරත්නයන්ගේ නම කියූ පමණින් ඔහුගේ රංගනයේ භූමිකාව හොඳින් හඳුනති. ඒ රසිකයෝ ඔහු විසින් සිංහල කලාවට දායාද කරන ලද රස උල්පත්වල මිහිර විඳ ඇත්තෝ වෙති. එපමණක් නොව සත් සමුදුරෙන් එපිට රට රාජ්‍යවල පවා මනෝරත්යන්ගේ කලාවේ ප්‍රතිභාව කිත් යසස් පතුරවා ලීමට සමත් වී තිබේ.

මනෝරත්න සිංහල නාට්‍ය වේදිකාවේ නූතන රජු විදියට සැළකුවොත් ඒක නිවැරදියි කියලයි මට හිතෙන්නෙ. මනෝරත්නයන්ගෙ කලාත්මක භූමිකාව ගැන සළකණවිට ඔහු අපේ විශිෂ්ටයන් අතර අතිවිශිෂ්ටයා කියල හැඳින්වීමත් එක්තරා විදියක අතිශයෝක්තියක් නොවෙයි.

මනෝගෙ රැඟුම් ගැයුම් නිතර දකින්නෙ නාට්‍ය වේදිකාවෙ. ඒ ඔහුගෙ ප්‍රධානතම කලාංගය නිසා. ඒ නිසාම ඔහු වේදිකා නාට්‍ය කරුවකු විදියටයි ලංකාවෙ රසිකයන් අතර බෙහෙවින්ම ජනප්‍රිය. ඊටත් වඩා පුංචි තිරය එහෙමත් නැත්නම් රූපවාහිනියෙ ටෙලිනාට්‍ය වල රංගන ශිල්පියෙකු ලෙසින් පමණක් නෙවෙයි කාටත් දැනෙන ටෙලි වෘත්තාන්තයක තිර රචකයෙක් එහෙමත් නැත්නම් අධ්‍යක්ෂකවරයෙක් විදියටත් අපට පුංචි තිරයේදි හමුවෙනව.

සිනමාවෙදි මනෝරත්තන අපට හමුවෙන්නෙ චිත්‍රපට නළුවකු හැටියට. ඒ සියල්ල ඔහුගේ නාටකීය භූමිකාව වුවත් එයින් ඔබ්බට විහිදී ගිය ඔහුගෙ කලාත්මක භූමිකාව සමහර විට අපේ රසිකයන්ගෙ මතකයෙන් බැහැරව ගිහින් තියෙන්න පුළුවන්. මනෝ අතින් ඉඳහිට ලියැවෙන කෙටිකතාවක්, කවියක්, ගීතයක් ඇහෙන කොට මේ ඉන්නෙ ඒ මනෝරත්නම ද කියල දෙවරක් හිතන්න තරම් රසිකයෝ පෙළඹෙන්නෙ සමහර වෙලාවලට එවන් භූමිකාවක් ගැන එතරම් රසිකයන්ට නොදැනෙන නිසා.

මනෝ අතින් ලියැවෙන එවන් කෙටිකතාවක, ගීයක කවියක පවා රැඳිල තියෙන සුන්දරම වදන් පේලි වල ගැඹුර ඔහුගේ සිතුවිලි ඔස්සෙ රංගන භූමිකාව එක්කම සමාන්තරව තියන්නත් පුළුවන්. ඊටත් වඩා සරසවි වල ඉගෙනුම ලබන සිසු සිසුවියන්ට සති අන්ත දිනවල දේශන පවත්වන ආරාධිත බාහිර කථිකාචාර්ය වරයෙක් විදියට ඔහු නිරූපණාය කරන්නෙ වෙනස්ම භූමිකාවක්. මේ විදියට එකිනෙකට වෙනස් හැඩතලවල එකිනෙකට වෙනස් භූමිකාවන් නිරූපණාය කරන කලාකරුවෙක් හැටියට අපට ඉන්න එකම එක්කෙනා අතිවිශිෂ්ඨ රංගධරයා ඔහුය. ඒ තමයි ජයලත් මනෝරත්න. ඔහුට වඩා තවත් දක්ෂයෙක් එහෙමත් නැත්නම් ඔහු අභිබවා යාහැකි තවත් රංගන ශිල්පියෙකු මෙරට සිටිනවා කියන එක පිළිගන්න අපහසු කාර්යක්. නළුකමින් එහෙමත් නැත්නම් රංගනයෙන්, අධ්‍යක්ෂණයෙන් , පිටපත් රචනයෙන් මිදුන වෙලාවක මනෝ අතින් ලියැවුණ ඉතාමත් ජනප්‍රිය ගීයක්තමයි මේ තියෙන්නෙ .

**ඔබ ඈත සඳ වී පායා**
**මම මෑත තරුවක පිපිලා**
**මේ නිසල රැයේ ලොව නිදනා**
**මා ඔබ, ඔබ මා ළග ඉන්නා**

**අප දුරින් දුරක වුව තනියේ**
**නෙත් සරින් පමණි හමු වූයේ**
**ඒ ඈත් බව්නි හද බඳුනේ**
**සෙනෙහසේ සොඳුරු බව පිරුණේ**

**මධු සඳ තරු අද හමුවිලා**
**සිටියද ඔබ මා ළං වීලා**
**ඒ දුරක එදා අප පිපිලා**
**තිබූ, සොඳුරු සෙනේ ගඟ සිඳිලා**

ගී පද මාලාව ■ ජයලත් මනෝරත්න
සංගීතය■ එච්.එම්.ජයවර්ධන
ගැයුම■ විශාරද බණ්ඩාර අතාවුද

1960 දශකයේ මැද භාගයේ හෙන්රි ජයසේනයන්ගේ මකරා නාට්‍යයෙන් ඇරඹී එතැන් සිට මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මනමෙ , සිංහබාහු වැනි නාට්‍ය වල කුඩා චරිතයකින් ඇරඹෙන සිංහල වේදිකාවෙ ගමන්මග තුළ අමරණීය සටහන් තියන්න සමත් වෙන්නෙ සරච්චන්ද්‍රයන්ගේ පෙමතො ජායති සෝකො නාට්‍යයෙන්. ඉන් පස්සෙ 70 - 80 දශකවල ලංකාවෙ බිහිවූ සියළුම අතිවිශිෂ්ඨ නාට්‍යකරුවන්ගේ නාට්‍ය සියල්ලක්ම පාහේ ඔහුගේ රංගනයෙන් හැඩ වෙනව. එහෙම අධ්‍යක්ෂකවරයෙකුට මනෝරත්න මගහැරුණා නම් ඒ කලාතුරකින්.

දශක පහකට ආසන්න කාලයක් තිස්සෙ විවිධ කලාත්මක භූමිකාවන් නිරූපණාය කරන මනෝරත්නයන් සිංහල නාට්‍ය වේදිකාවෙ මැවූ මනමෙ නාටකයේ රාජගුරු චරිතය වගේම වෙස-'සන්තර නාටකයේ වෙස්සන්තර රජුගෙ භූමිකාවත් නිරූපණය කරනව.ඒ භාවාත්මක රංගන ශෛලියකින්. එහෙමත් නැත්නම් ඊට හාත්පස වෙනස් විනෝදයක් සපයන දයානන්ද ගුණවර්ධනගෙ ජසයා සහ ලෙංචිනා නාට්‍යයේ ජසයගෙ චරිතය නිරූපනය කරන්නෙ ජන සම්ප්‍රදාය ඇසුරු කර ගනිමින්.

ගම්වල සැම තැන ඇවිද ගොසින්නේ
වෙල්ලාවට රෙදි පුරවා ගන්නේ

මේ විදියට ඔහුගෙ රසමුසු ගී රාවය ප්‍රේක්ෂකාගාරයට පතිතවූ සැනින් ඔහුගේ භාවාත්මක රංගන ශෛලිය විනෝදයක් සපයන මාධ්‍යක් බවට පත්වෙන්නට ගත වෙන්නෙ නිමේෂයක්.

ඒ විදියට එකකට එකක් වෙනස් සංකීර්ණ රංගන පරාසයන් තුළ සිය දක්ෂතාවයන් සියුම් හැඩතලවලින් මුවහත් කරන මනෝරත්නයන්ගේ රංගනයෙන් හැඩ වූ දිවැස හෙළනු මැන, පුත්‍ර සමාගම, ද්විත්ව, තාරාවෝ ඉගිලෙති, රතුහැට්ටකාරී, මායාදේවී, නාගගුරුලා, තලමල පිපිලා, අන්දරේලා, ගුරු තරුව, සොක්‍රටීස්, මධුර ජවනිකා, ගජමන් පුවත, සිරිසගබෝ, අංගාරා ගග ගලාබසී මහගිරි දඹ, වැනි නාට්‍ය ඉතිහාසයේ ඔහු මැවූ අපූර්ව රංගන ප්‍රතිභාව ඔහු අතිවිශිෂ්ඨ රංගධරයෙකු බවට පත්කරනව.

මනෝරත්නයන් 70 දශකය ආරම්භයේ සුනිල්



ආරියරත්න, බුද්ධදාස ගලප්පත්ති සමග ණිදොළොස් මහේ පහන□ නමින් කවිපොතක් ලියා පළකරනව. ඒත් ඉන් පස්සෙ නම් ඔහුගෙ කවිත්වය කාව්‍ය සංග්‍රහ ඔස්සෙ අපිට හමුවෙන්නෙ නැහැ. ඉන් පස්සෙ මනෝරත්නයන්ගෙ ප්‍රධාන මාධ්‍ය වේදිකා නාට්‍ය හෝ ටෙලි නාට්‍ය ක්ෂේත්‍ර වුවත් ඒ ක්ෂේත්‍රයන්ගෙම ඉන්න අතරෙ මනෝරත්නයන් අතින ලියැවෙන මෙවන් සුන්දර පද පෙළක් සවනට වැටෙනකොට අපට වේදිකාවෙ හමුවෙන මනෝරත්න ගෙ සියලූ චරිත අමතකව මේ ගී පද අතර සැගවුණ සාහිත්‍යකරුවා එහෙමත් නැත්නම් කවියා හමුවෙනව. ඒ හරහ ඔහුගෙ කවි සිත අපේ හිත්වලට එබිල බලනව. එහෙම ඉඳහිටල එබිකම් කරන කවියාගේ සැබෑ ස්වරූපය අපට පේන්න ගන්නව. මෙන්න මේ විදියට

නිසල කඳු මුදුන් පිබිදී මීදුම් මල් පිපෙනා
සිහිල් දිය ඉරක් විය ඔබ උදෑසනක ගලනා

බක් මී මල් රේණු ඇදී මාරුතයේ නටනා
ජීවිතයේ හැන්දෑවක සමීපයේ හිඳිනා
සෙනෙහස ඔබ පම□

කලාමැදිරි මල් පිබිදී රැයෙක අඳුර හඬනා
ජීවිතයේ විරාමයක ඔබ සැතපුණ සැණිනා
මතකය ඔබ පමණි

ගී පද මාලාව ■ ජයලත් මනෝරත්න
සංගීතය■ තිස්සසිරි පෙරේරා
ගැයුම■ ලක්ෂ්මන් විජේසේකර

මනෝරත්යන්ගෙ නාට්‍යවල මෙන්ම ඔහුගෙ ගී වලත් තියෙන්නේ රසිකයන් නැවුම් ආනන්දයකින් හිත පුරවන හැගීම්. ගලන ගග දිහා දෙවරක් බලන්නෙකුට එකම ගග දෙවරක් දැකිය නොහැකිය කියන අදහස මනෝ නිරූපනය කරන නාට්‍යවලත් දකින්න ලැබෙනව. එකම නාට්‍ය වුණත් එකම වේදිකාවෙ රග දැක්වෙන වාරයක් වාරයක් පාසා ඒ නාට්‍ය බලන රසිකයන් වගේම ඒ නාට්‍යත් අලූත් අත්දැකීමක් නැවුම් අත්දැකීමක් බවට පත් කරනව. ඔහුගෙ නාට්‍ය සහ රංගනය හැම විටම සජීවිව තියෙන්නෙ , ඒ බව රසිකයන්ට දැනේනෙ ඒ නිසා.

එහෙම වුණත් සිංහල සිනමාවෙත් ඉදල හිටල අපට හමුවන මනෝරත්නයන්ගෙ සිනමා භූමිකාව ගැඹුරු ලෙස වටහාගන්න චිත්‍රපට අධ්‍යක්ෂකවරුන්ට තවමත් හැකියාව ලැබිල නැහැ කියලයි මට හිතෙන්නෙ. නාට්‍ය වේදිකාව තරමක් දුරට ඈත්කරල ඔහු සිනමාවේ රංගන ශිල්පියෙකු බවට පත් කළහොත් සිනමා රංග ධරයෙකුගේ භූමිකාව කොතරම් දුරට විකසිත වී ඇද්දයන්න අපට දැකගන්න පුළුවන්. එහෙම වුනත් ඉඳ හිට සිංහල චිත්‍රපටයක ඔහු මවන චරිතය පවා සිනමාවෙ ඔහුට අවශ්‍ය වපසරිය සකස්කර ගත් බව පෙන්වනව.

ලංකාවෙ නාට්‍ය කලාව අද වනවිට කොළඹ නගරයට පමණක් සීමාවෙලා. කලාතුරකින් කොළඹින් පිටත නාට්‍යයක් රගදැක්වෙනවා නම් ඒ සමහර විට තදාසන්න නගරයක විය හැකියි. ඉස්සර ගම්දනව්වල පාසැල් ගානෙ ගිහින් නාට්‍ය පෙන්වපු කාලයක් තිබුණා. 3.30 දර්ශනය වෙන්වෙලා තිබුණෙ පාසල් දරුවන්ට. 6.30 වෙන්වෙලා තිබුණෙ වැඩිහිටි දර්ශන වාරයට. එහෙම ස්වර්ණමය යුගයක තිබුණ වේදිකා නාට්‍ය කලාව තවදුරටත් අත නොහැර ඒ මත්තෙම තමන්ගෙ භූමිකාව තවදුරටත් සජීවිව ප්‍රේක්ෂකයන එක්ක සංවාදයේ යෙදෙන්න මනෝරත්නයන් උත්සාහ ගන්නව. ඒ අනෙකක් නිසා නෙවෙයි. ඔහු තවමත් ඒ වේදිකාවට පෙම් බඳින නිසා. ඒ නිසාම මාර්තු 17 * 23 සතිය ඔහුගෙ රංගන ජීවිතයෙ දවස් පාලොස්දාහක අබිසෙස් ලබනව.

ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයෙන් මනෝරත්නයන් සිංහල නාට්‍ය කලාව ගැන ලීයූ නිබන්ධනයට පිරි නැමූ ආචාර්ය උපාධියත් , මනෝරත්නයන්ගේ දශක පහක රංගනයේ කීර්තිමත් භූමිකාව වෙනුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් පිරිනැමූ සාහිත්‍ය සූරී උපාධියත් තවදුරටත් ඔහු මේ ක්ෂේත්‍රයේ රඳවා තබන්නට රසික උත්තේජනයක් බවට පත්වෙනව. ඒ කුමන ආචාර්ය උපාධිය ලැබුණත් මනෝරත්නයන් ප්‍රේක්ෂකාගාරයේ දී දවස් පාලොස්දාහක් තිස්සෙ ලබන උණුසුමට සමකරන්න හැකි ප්‍රේක්ෂක උපාධියක් තවම ඔහුට හමුවෙලා නැතුව ඇති.